# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1918/31 - 2015 ජුනි මස 13 වැනි සෙනසුරාදා - 2015.06.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

### පළාත් සභා නිවේදන

**උතුරු මැද පළාතේ පළාත් සභාව**

1990 අංක 02 දරන අධ්‍යාපන ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු මැද පළාතේ පළාත් සභාව විසින් සම්මත කොට 1990 අප්‍රේල් මස 10 වන දින උතුරු මැද පළාතේ පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් සහතික කරන ලද පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පහත පළ කරමි.

ආර්. කේ. ප්‍රේමසිරි,
ලේකම්,
උතුරු මැද පළාත් සභාව.

2015 ජුනි මස 12 වැනි දින,
උතුරු මැද පළාත් සභාවේ දී ය.

**1990 අංක 02 දරන අධ්‍යාපන ප්‍රඥප්තිය**

උතුරු මැද පළාත් සභාවේ අධ්‍යාපන කටයුතුවලට අදාළව පනවන ලද විධිවිධාන ඇතුළත් ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ 9 වැනි උප ලේඛනයේ පළමුවන ලැයිස්තුවේ තුන්වැනි උප වගන්තියේ සහ තුන්වැනි පරිශිෂ්ඨයේ සඳහන් ප්‍රකාර පවරා දෙනු ලබන කාර්යයන්ට අනුව ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව පිහිටුවීම සඳහා පනවනු ලබන ප්‍රඥප්තියයි.


1A - PG 2511 — 106 (2015/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු මැද පළාතේ පළාත් සභාව මගින් මෙසේ නීති පනවනු ලැබේ.

01. මෙම ප්‍රඥප්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, උතුරු මැද පළාත් සභාවේ 1990 අංක 02 දරන අධ්‍යාපන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරනු ලබන දිනයේ සිට බල පවත්වනු ඇත.

02. මෙම ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙකුගෙන් හා කලින් කලට පත් කරනු ලබන වෙනත් නිලධාරීන් හා කාර්ය මංඩලයකින් සමන්විත අධ්‍යාපන දෙපාර්තමේන්තුවක් පිහිටුවනු ලැබේ.

03. I. අධ්‍යාපන ඇමතිවරයා විසින් නිකුත් කරනු ලබන නියෝග සහ පාලනයට යටත්ව අධ්‍යක්ෂවරයා සහ අනෙකුත් දෙපාර්තමේන්තු නිලධාරීන් ක්‍රියා කල යුතු වන අතර, මෙම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන සහ ඒ යටතේ පනවනු ලබන රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ බලය, ඉහත කොන්දේසියට යටත්ව, අධ්‍යක්ෂවරයා සහ අනෙකුත් දෙපාර්තමේන්තු නිලධාරීන් වෙත පවරනු ලැබේ.

II. මෙම ව්‍යවස්ථාවෙන් හෝ ඒ යටතේ පනවන ලද රෙගුලාසි මගින් හෝ අධ්‍යක්ෂවරයා වෙත පැවරෙන බලය ඔහු විසින් පාවිච්චි කිරීමේදී අධ්‍යක්ෂවරයා විසින් ගනු ලබන තීරණ හෝ නිකුත් කරනු ලබන නියෝග, අභියාචනා කිරීම නිසා හෝ එසේ නොමැතිව අමාත්‍යවරයා විසින් අවලංගු කරනු ලැබීම හෝ වෙනස් කරනු ලැබීම නීත්‍යානුකූල වේ. අමාත්‍යවරයාගේ තීරණය අවසාන තීරණය වන අතර, අධ්‍යක්ෂවරයා සහ අදාළ අනෙකුත් සියළුම පුද්ගලයන් එම තීරණය පිළිගැනීමට බැඳී සිටිති.

*1 කොටස*

උතුරු මැද පළාත සඳහා අධ්‍යාපන උපදේශක කමිටුවක්, කොට්ඨාස අධ්‍යාපන උපදේශක කමිටු සහ පාසැල් උපදේශක මණ්ඩල පිහිටුවීම.

04. I. ප්‍රධාන ඇමතිවරයාගේ එකගත්වය ඇතිව පුද්ගලයින් සත් දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත උතුරු මැද පළාත සඳහා අධ්‍යාපන උපදේශක කමිටුවක් පිහිටුවනු ලැබේ.

II. අමාත්‍යවරයා විසින් අමාත්‍යාංශයේ ලේකම්වරයා මෙම උපදේශක කමිටුවේ සභාපතිවරයා හැටියට පත් කරනු ලැබේ.

III. අමාත්‍යවරයා විසින් පත් කරන ලද දෙපාර්තමේන්තු නිලධාරියෙකු කමිටුවේ ලේකම්වරයා හැටියට ක්‍රියා කරනු ඇත.

IV. උපදේශක කමිටුවේ කාර්ය වනුයේ අමාත්‍යවරයා විසින් කමිටුව වෙත උපදෙස් සඳහා යොමු කරනු ලබන අධ්‍යාපනයට අදාළ සෑම කරුණක් සම්බන්ධයෙන්ම සහ කමිටුව විසින් උපදෙස් දිය යුතු යැයි සිතන සෑම කරුණක් සම්බන්ධයෙන් ද ඇමතිවරයාට උපදෙස් දීමය.

V. උපදේශක කමිටුව කැඳවීම සහ උපදේශක කමිටුවේ සභා පැවැත්වීම මෙන්ම සභාවේ කටයුතු කරගෙන යාම සහ කමිටු රැස්වීම් වලදී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය, පළාත් සභාවේ අනුමැතිය සහිතව ඇමතිවරයා විසින් ප්‍රතිපාදනය කරනු ලැබේ.

VI. උපදේශක සභාවේ ඕනෑම සාමාජිකයෙක් ඕනෑම අවස්ථාවක එම තනතුරින් ඉවත් කිරීමේ බලය අමාත්‍යවරයා සතුවන අතර, උපදේශක සභාවේ ඕනෑම සාමාජිකයෙකුට ඇමතිවරයා වෙත ලිඛිතව දැනුම් දීමෙන් එම තනතුරින් ඉල්ලා අස්වීමට පුලුවන.

VII. සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වී හෝ සාමාජිකත්වය හැර ගොස් හෝ අමාත්‍යවරයා විසින් නිලයෙන් පහ කරන ලද හෝ නොමැති සෑම උපදේශක කමිටු සාමාජිකයෙක්ම ඔහු මුලින් පත් වූ දින සිට දෑවුරුදු කාලයක් එම නිලය දරනු ඇත.

05. I. පළාතට අයත් කොට්ඨාස වල අධ්‍යාපනයට අදාල නොයෙකුත් කරුණු සහ අධ්‍යාපනික අවශ්‍යතා පිළිබඳව අධ්‍යක්ෂවරයාට උපදෙස් දීම සඳහා අමාත්‍යවරයා විසින් කොට්ඨාස උපදේශක කමිටු පත් කරනු ඇත.

II. සෑම කොට්ඨාස උපදේශක කමිටුවක්ම පහත සඳහන් අයගෙන් සමන්විත වේ.

(අ). කොට්ඨාස භාර අධ්‍යාපන අධ්‍යක්ෂ.

(ආ). මහ නගර සභාවේ නගරාධිපතිවරයා, නගර සභාවේ සභාපතිවරයා සහ කොට්ඨාසය තුළ ඇති ප්‍රාදේශීය සභාවල සභාපතිවරුන්.

(ඈ). මහ නගර සභාවේ කොමසාරිස්වරයා, නගර සභාවේ ලේකම්වරයා සහ අධ්‍යාපන කොට්ඨාසය තුළ සිටින සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්.

(ඇ). පළාත් අධ්‍යක්ෂවරයා විසින් නම් කරනු ලබන අධ්‍යාපන කොට්ඨාසය තුළ සේවය කරන විදුහල්පතිවරුන් තිදෙනෙක්.

(ඉ). කොට්ඨාස භාර අධ්‍යක්ෂවරයා විසින් නම් කරනු ලබන, කොට්ඨාසය තුළ පිහිටි පාසැල් වලින් තෝරා ගන්නා ලද පස් දෙනෙකුට නොවැඩි ශිෂ්‍ය නායකයින් සංඛ්‍යාවක්.

III. අධ්‍යාපන කොට්ඨාසයේ කොට්ඨාසය භාර අධ්‍යාපන අධ්‍යක්ෂ කොට්ඨාස අධ්‍යාපන උපදේශක කමිටුවේ සභාපතිවරයා ලෙස කටයුතු කරනු ඇත.

IV. කොට්ඨාස උපදේශක කමිටුවේ ප්‍රථම රැස්වීමේදී, කමිටුවේ සාමාජිකයින් අතුරින් ලේකම්වරයෙකු පත් කරගනු ලැබේ.

V. අධ්‍යක්ෂවරයා විසින් කොට්ඨාස උපදේශක කමිටුව වෙත සලකා බැලීම සඳහා යොමු කරනු ලබන සෑම කටයුත්තක් ම නියමිත කාලයේ, නියමිත ආකාරයට කැඳවනු ලැබ පවත්වනු ලබන කොට්ඨාස උපදේශක කමිටු රැස්වීම් වලදී සාකච්ඡා කොට විසඳා අවසන් කරනු ලැබේ.

VI. ව්‍යවස්ථාව යටතේ කුමන කොට්ඨාසයක් සඳහා හෝ පිහිටුවන ලද කොට්ඨාස උපදේශක කමිටුව වෙත මොනයම් කටයුත්තක් සඳහා හෝ විධායක හෝ පරිපාලන බලතල හෝ රාජකාරි පවරා දී නොමැත. එමෙන්ම අධ්‍යක්ෂවරයා විසින් සලකා බැලීම සඳහා කොට්ඨාස උපදේශක කමිටුව වෙත යොමු කරන ලද එම කොට්ඨාසයේ අධ්‍යාපනයට අදාල කාර්යයන් හා එම කොට්ඨාසයේ අධ්‍යාපනික අවශ්‍යතාවලට අදාල කාර්යයන් සඳහා අවශ්‍ය උපදෙස් දීම හෝ නිර්දේශ කිරීම හැරුනවිට වෙනත් කිසිම කර්තව්‍යයක් කොට්ඨාස උපදේශක කමිටුව වෙත නොපැවරේ.

06. I. පළාතේ සෑම කොට්ඨාසයකම පිහිටි, සෑම පාසැලක් සඳහාම පාසැල් උපදේශක කමිටු පිහිටුවනු ලැබේ.

II. පාසැල් උපදේශක කමිටු කාර්යයන් වනුයේ අධ්‍යක්ෂවරයා විසින් යොමු කරනු ලබන විටක හෝ කමිටුව සුදුසු යැයි කල්පනා කරන විටක, පාසැලේ පාලනය, සංවිධානය, සංවර්ධනය සහ විද්‍යාලයීය කටයුතු ක්‍රියාත්මක කිරීම ආදියට අදාළ සියලුම කටයුතු සම්බන්ධයෙන් පාසැල පාලනය කරන්නන්ට උපදෙස් දීමයි.

III. පාසැල් උපදේශක කමිටු මොනයම් කාර්යයක් සඳහා හෝ කිසිම පරිපාලන හෝ විධායක බලතල හෝ පරිපාලන හෝ විධායක කාර්යයන් පවරා දී නොමැත.

IV. පාසැල් උපදේශක කමිටුව පහත සඳහන් අයගෙන් සමන්විත වේ. විදුහල්පතිතුමා සහ ආචාර්ය මණ්ඩලයේ පස් දෙනෙකුගෙන් (ආචාර්ය මණ්ඩලයේ සාමාජිකයින්ගෙන්).

V. පාසැල් උපදේශක කමිටුවේ සභාපතිවරයා පාසැලේ විදුහල්පතිවරයා ය.

VI. පාසැල් සංවර්ධන සමිතිය විසින් නම් කරනු ලබන එහි සාමාජිකයින් පස් දෙනෙක්.

VII. පළාත් උපදේශක කමිටුවේ මග පෙන්වීම සහ පාලනය යටතේ පළාත් අධ්‍යාපන උපදේශක කමිටුවේ මොනයම් හෝ කාර්යයක් ක්‍රියාත්මක කිරීම සඳහා සහ අධ්‍යාපනයේ විශේෂ ක්ෂේත්‍රයන් සඳහා උප කමිටු පත් කිරීමේ බලය පළාත් උපදේශක කමිටුව සතුය. මෙසේ පත් කර ගන්නා උප කමිටුවට විශේෂ ක්ෂේත්‍රයන් සඳහා වෙනත් උප කමිටු පත් කිරීමේ හැකියාව ඇත.

07. යම්කිසි අයදුම්කරුවෙකුගේ හෝ ඔහුගේ දෙමව්පියන්ගෙන් කෙනෙකුගේ හෝ ආගම, ජාතිය, කුලය, සමාජ තත්වය හෝ භාෂාව හේතු කොටගෙන එම අයදුම්කරුවාට යම් පාසැලකට ඇතුලත්වීමට ඉඩදීම ප්‍රතික්ෂේප කළ නොහැකිය.

08. පාසැල් ගොඩනැගිලි, නිළ නිවාස, කාර්යාල හෝ කාර්යාල භූමි, ඉදිකිරීම සඳහා හෝ පුළුල් කිරීම සඳහා මෙන්ම පාසැල් වතු සහ ක්‍රීඩා පිට්ටනි පිහිටුවීම යන කාර්යයන් සඳහා හෝ මෙම ව්‍යවස්ථාවේ කුමන කාර්යයක් සඳහා හෝ යම්කිසි පෞද්ගලික ඉඩමක් අවශ්‍ය බව හැඟී ගියහොත් එම ඉඩම පවතින පළාත් ඉඩම් නීතියේ ප්‍රතිපාදන වලට අනුව පවරා ගැනීමේ බලය පළාත් සභාවට ඇත.

09. I. පළාත් අමාත්‍යාංශයේ අධිකාරය යටතේ පවතින කිසිම පාසැලකට සිසුන් ඇතුලත් කිරීම සඳහා මොනයම් හෝ ගාස්තුවක් අය කළ නොහැකිය.

II. අංක 1 උප කොටසේ සඳහන් දෙයට අමතරව, ක්‍රීඩා ශාරීරික අභ්‍යාස හෝ අධ්‍යාපනික විනෝදාංශ හෝ සෞඛ්‍ය කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා වැය වන මුදල වෙනුවෙන් ඕනෑම පාසලක සිසුන්ගෙන් ගාස්තුවක් හෝ ගාස්තු අය කිරීම සඳහා අවශ්‍ය බලය පැවරීමේ රෙගුලාසි පැනවීමට මෙම ව්‍යවස්ථාව යටතේ ඉඩ තිබේ.

10. ඇමතිවරයා හෝ අධ්‍යක්ෂවරයා හෝ අමාත්‍යාංශයේ හෝ දෙපාර්තමේන්තුවේ කිසියම් අධීක්ෂණ නිලධාරියෙක් හෝ අමාත්‍යවරයා හෝ අධ්‍යක්ෂවරයා විසින් බලය පවරනු ලැබූ පුද්ගලයෙක් හෝ විසින් ඕනෑම පාසලකට ඇතුළු වී එහි වැඩ කටයුතු හෝ දේපල පරීක්ෂා කිරීම නීත්‍යානුකූලය.

11. පළාතේ පාසල් සිසුන්ට සහායවීම, ඔවුන් සංවර්ධනය කිරීම සහ ඔවුන්ගේ හැකියාවන් වැඩි දියුණු කිරීම යනාදිය සඳහා පළාත් අධ්‍යාපන අරමුදලක් පිහිටුවනු ලබන අතර, එම අරමුදල පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය රෙගුලාසි පැනවීම ඇමතිවරයා විසින් කරනු ලැබේ.

*II කොටස*

**රෙගුලාසි පැනවීම සඳහා ඇමතිවරයාට ඇති බලතල**

12. 1. මෙම ව්‍යවස්ථාවේ සඳහන් ප්‍රතිපාදන සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරවීම සඳහා රෙගුලාසි පැනවීමට ඇමතිවරයාට හැකියාව ඇති අතර, මෙසේ පනවනු ලබන රෙගුලාසි ලිඛිත නීති නමින් හැඳින්වේ.

2. විශේෂයෙන්ම පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් රෙගුලාසි පැනවීමට ඇමති වරයාට පුළුවන :-

I. ජාතික පාසල්, ආරක්ෂක සේවා නිළධාරින් සඳහා ඇති විශේෂ පාසල් සහ විශේෂ සංවර්ධන වැඩ සටහන් සඳහා වෙන් කොට ඇති පාසල් යන මේ පාසැල් වර්ග හැරුණු විට පළාතේ අනෙකුත් සියළුම පාසල් වලට අවශ්‍ය පහසුකම් සපයා දීම ;
II. ඉහත 12 (2) 1 යටතේ සඳහන් කරන ලද විශේෂ පාසල් හැරුණු විට පළාතේ අනෙක් පාසල් සහ සියළුම පෙර පාසල්වල පාලනය අධීක්ෂණය කිරීම ;
III. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගුරු සේවයට සහ ඊට සම්බන්ධ අනෙකුත් සේවාවන් සඳහා පුද්ගලයින් බඳවා ගැනීම ;
IV. 1 ඒ, බී සහ සී කාණ්ඩ වලට අයත් නොවන පළාතේ සියළුම පාසල් වලට විදුහල්පතිවරුන් පත් කිරීම ;
V. අධ්‍යාපන කෂේත්‍රයට අදාළ සියළුම පුද්ගලයින්ගේ මාරු කිරීම් සහ විනය පාලනය ;
VI. පළාත් අධ්‍යාපන සංවර්ධන සැලැස්ම සහ කොට්ඨාස අධ්‍යාපන සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම සහ ක්‍රියාත්මක කිරීම ;
VII. වාර්ෂික අධ්‍යාපන සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම ;
VIII. විදුහල්පතිවරුන්ගේ, ගුරුවරුන්ගේ සහ අනෙකුත් අධ්‍යාපනයට අදළ සෑම නිලධාරියකුගේම වැඩ කටුයතු ඇගයීම;
IX. සේවාස්ථ පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම ;
X. විභාග කොමසාරිස්වරයා විසින් අනුමත කරනු ලබන ප්‍රාදේශීය විභාග පැවැත්වීම ;
XI. අවිධිමත් අධ්‍යාපන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම ;
XII. පෙර පාසල් ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම ;
XIII. ප්‍රාථමික විෂය මාලාවේ සහ ද්වීතියික විෂය මාලාවේ තෝරාගත් විෂයන්ගේ ප්‍රාදේශීය මට්ටමේ වෙනස්කම් ඇතිකිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ අනුමැතිය ලබා ගැනීම ;
XIV. අධ්‍යාපනික ගොඩනැගිලි, පුස්තකාල සහ ක්‍රීඩා පිට්ටනි ඉදිකිරීම සහ නඩත්තු කිරීම ;
XV. ඉගැන්වීමේ ආධාර උපකරණ, දෘශ්‍යාධාර සහ ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ලීබඩු සහ අනෙකුත් උපකරණ ලබා ගැනීම සහ බෙදු හැරීම ;
XVI. විද්‍යා උපකරණ ලබා ගැනීම සහ බෙදු හැරීම ;
XVII. අමාත්‍යාංශයේ අවසරය ලබාගෙන පාසල් පොත් නිපදවීම සහ බෙදු හැරීම ;
XVIII. ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ මග පෙන්වීම අනුව පාසල් පුස්තකාල සංවිධානය කිරීම සහ සංවර්ධනය.
XIX. පළාත් තුළ පිහිටි කුමන හෝ කොට්ටාස අධ්‍යාපන කාර්යාලයක සීමාවන් තීරණය කිරීම.
XX. පළාතේ විදුහල්වලට බඳවා ගැනීම පාඨමාලා සහ අධ්‍යයන වැඩ සටහන් සහ අතිරේක කියවීම් පොත්, භාවිතා කළ යුතු උපකරණ.
XXI. පළාතේ සියළුම පාසැල් හෝ යම්කිසි නම් කරන ලද පාසැල් හෝ යම් පාසැලක එක්තරා පන්තියක් හෝ සම්බන්ධයෙන් පන්ති පැවැත්විය යුතු දින වකවානු සහ කාලසීමාවන් මෙන්ම නිවාඩු දිනයන් තීරණය කිරීම.

XXII. පාසැල් සිසුන් සඳහා වෛද්‍ය පරීක්ෂණ හෝ ප්‍රතිකාර ලබාදීම, සිසුන්ගේ සෞඛ්‍ය සහ නොමිලේ ආහාර ලබාදීම මෙන්ම නොමිලේ පොත් ලබා දීම ඇතුළු ශිෂ්‍ය සුභසාධක කටයුතු.

XXIII. ජාතික අමාත්‍යාංශය විසින් අනුගමනය කරනු ලබන ප්‍රතිපත්ති සහ ප්‍රමිතීන්ට අනුව පළාතේ පාසැල් ශ්‍රේණි කිරීම, උසස් කිරීම, වර්ග කිරීම සහ නව පාසැල් විවෘත කිරීම.

XXIV. පළාතේ වැඩිහිටි අධ්‍යාපනයට සම්බන්ධ සැලසුම් පිළියෙල කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

XXV. පළාතේ අධ්‍යාපනික අවශ්‍යතාවයන් බාධාවකින් තොරව පවත්වාගෙන යාම අරමුණු කොට ගෙන, පළාතේ අයවැය ලේඛනය සැකසීම සහ මුදල් පාලනය.

XXVI. රෙගුලාසි පැනවීම සඳහා සුදුසු යැයි ඇමතිවරයා සිතන වෙනත් ඕනෑම වැදගත් කරුණක්.

3. මෙම ව්‍යවස්ථාව යටතේ සකස් කරනු ලබන සෑම රෙගුලාසියක්ම පළාත් සභාවේ අනුමැතිය ලැබීමෙන් පසුව වලංගු වේ.

## *III කොටස*

### සාමාන්‍ය

13. 1. යෙදී ඇති ආකාරය අනුව වෙනත් අර්ථයක් නොදෙන්නේ නම්, මෙම ව්‍යවස්ථාවේ සඳහන් වන අන්දමට,

''ආණ්ඩුකාරවරයා'' යනු උතුරු මැද පළාතේ ආණ්ඩුකාරවරයාය.

''ප්‍රධාන ඇමතිවරයා'' යනු උතුරු මැද පළාතේ ප්‍රධාන ඇමතිවරයාය.

''අමාත්‍යවරයා නොහොත් ඇමතිවරයා' යනු උතුරු මැද අධ්‍යාපන විෂය භාර ඇමතිවරයාය.

''ලේකම්'' යනු උතුරු මැද පළාතේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාය.

''අධ්‍යක්ෂවරයා'' යනු උතුරු මැද පළාත් අධ්‍යාපන, අධ්‍යක්ෂවරයා හෝ මෙම ව්‍යවස්ථාව යටතේ අධ්‍යක්ෂවරයාගේ බලය පිට අධ්‍යක්ෂවරයා සතු බලතල පාවිච්චි කිරීමට සහ රාජකාරි ක්‍රියාත්මක කිරීමට බලය පවරා දී ඇති ඕනෑම දෙපාර්තමේන්තු නිලධාරියෙක්ය.

''දෙපාර්තමේන්තුව'' යනු උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවයි.

''පළාත් උපදේශක කමිටුව'' යනු 4 (1) ඡේදයේ සඳහන් ප්‍රකාර පිහිටුවා ගන්නා ලද පළාත් උපදේශක කමිටුවයි.

''කොට්ඨාස උපදේශක කමිටුව'' යනු 5 (1) ඡේදයේ සඳහන් කරන ලද කමිටුවයි.

"පාසැල් උපදේශක කමිටුව" යනු 6 (1) ඡේදයේ සඳහන් කර ඇති මණ්ඩලයකි.

"අධ්‍යාපන අවශ්‍යතා" යනු රෙගුලාසි මගින් ප්‍රකාශයට පත් කෙරෙන පරිදි ප්‍රමාණවත් අධ්‍යාපන සහ කාර්මික පුහුණුව සඳහා අවශ්‍ය පහසුකම්ය.

2. එසේ නොවන බව ඔප්පු කරනු නොලැබුවහොත්, යම් ළමයෙකු සාමාන්‍යයෙන් නැවතී සිටින ස්ථානයේ පදිංචිකරුවාට එම ළමයාගේ නියම භාරකාරත්වය හිමිවනු බව සළකනු ලැබේ.

06 - 825

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.